# මාලිමාවේ අභිරහස



සෙනුලි රශ්විතා මෙනන්

## මාලිමාවේ අභිරහස

සෙනුලි රශ්විතා මෙනන්

### වෙනත් කෘතීන්

- අපේ සීයා තාත්තා සුරංගනා ලෝකයට ගිය හැටි
- සමනල කඩය
- බිය වුන පූස් රාළ

2023 නෙවැම්බර් 15

ISBN 978-624-206-597-7

# පිදුම

මට හැමදාම ආදරය කරන
අම්මා, තාත්තා, නංගී ඇතුළු පවුලේ සියලු
දෙනාටත්,
මගේ සියලුම යහළුවන්ටත්
මට අකුරු කියවූ චන්ද්‍රලතා ගුරු මෑණියන්ටත්,
චම්පිකා ගුරු මෑණියන්ටත්, නිල්මිණි ගුරු මෑණියන්
ඇතුළු මට සිප් කිරි පෙවූ සියලු ගුරු මෑණිවරුන්
සහ පියවරුන්ටත්, ග්‍රන්ථකරණය සඳහා
නිරන්තරයෙන් අප දිරිමත් කරන
සෙනෙවිරත්න ගුරු පියාණන්ට සහ අපගේ
විදුහල්පතිතුමියටත් මාගේ මේ කෘතිය
බැති සිතින් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන, ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක් “ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක් “ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

**ශෂිකලා සේනාධීර**
විදුහල්පතිනිය,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.11.01

# පටුන

පිටු අංකය


| | |
|---|---|
| අඟහරු ලෝකයට චාරිකාවක් | 01 - 06 |
| මුහුදු පතුලට ගමනක් | 07- 09 |
| කුරුළු උයනට චාරිකාවක් | 10- 12 |



# අඟුහරු ලෝකයට චාරිකාවක්

ෆ්ලොරිඩා නගරයේ ධනවත් පවුලක් ජීවත් වුණා. ඒ පවුලේ සිටියේ අම්මයි, තාත්තයි, පුතයි, දුවයි, ඒ ගොල්ලන්ගෙ බලු පැටියයි. දුවගේ නම ජෙනී. පුතාගෙ නම ජේසන්, බලු පැටියගෙ නම ජෙරී. ජෙනීගේ උපන්දිනයට තාත්තා ගෙනත් දුන්නේ මාලිමාවක්. ඒක හරිම පුදුම මාලිමාවක්.

ඒකෙ කටු වෙනුවට තිබුණේ සටන් කඩු. අකුරු වෙනුවට තිබුණේ රහස් වචන. මුහුණත වෙනුවට තිබුණේ අශ්ව මුහුණක්. ඒකට අපූරු බලයක් තිබුණා. ඒකට පුළුවන් කැමති තැනකට අපිව ගෙනියන්න.

එක් දවසක් ජෙනී උදෙන්ම නැගිට්ටා. මාලිමාව ළඟ රන්වන් පාට මැණිකක්. ''අයියේ, මේ බලන්න මැණිකක්,'' ජෙනී කෑගැසුවා. එතකොට ම මැණික් කැටය කතා කරලා මෙහෙම කිව්වා. '' මේ මාලිමාව හරහා ඔයාට කැමති තැනකට යන්න පුළුවන්. ඔයාලා යන්නේ කොහෙටද යාළුවනේ. ?''

''අඟුහරු ලෝකයට'' ජේසන් සතුටින් කිව්වා. '' මට නම් ටිකක් බයයි වගේ අයියේ'' ජෙනී කීවා. '' බය වෙන්න එපා නංගී, මම ඉන්නවානේ'' '' අපි එහෙනම් යමු, අඟුහරු ලෝකයට.'' අයියයි, නංගියි මැණික් කැටෙත් එක්කම ඉබේම විශාල වුණු මාලිමාව ඇතුළට පැනගත්තා.

හැබැයි පේරීට නම් පැනගන්න බැරි වුණා.

" කෝ අඟහරු ලෝකය තාම පේන්න නැහැ" ජෙනී ඇහුවා. " තව ටික දුරක් යන්න තියෙනවා. " මාලිමාව ඇතුළේ හිටපු මැණික් කැටය කිව්වා. " දැන් මේ මාලිමාව රොකට්ටුවක් වෙලා අපිව අඟහරු ලෝකයට ගෙන යාවි."

" යේ ...... තුන.... දෙක.... එක.... හුරේ..... අපි අඟහරු ලෝකයට ආවා" ජේසන් උඩ පැන්නා. මේ තියෙන්නේ අරුම පුදුම අඟහරු ලෝකය.

"අර මොකක්ද ?" ජෙනී ඇහුවා.

"රහස් දොරක් අපි යමු ඇතුළට " ජේසන් ජෙනීව ඇදගෙන ගියා. එයාලා හොරෙන් එබිලා බැලුවා.

" පිටසක්වල ජීවීන්ගේ උත්සවයක්! "

එහෙ කොළ පාට, අළු පාට, නිල් පාට විවිධ හැඩවල වෙනස් වෙනස් පිටසක්වල ජීවීන් හිටියා. ජේසන්ලාව දැකපු පිටසක්වල ජීවින් ගොරවගෙන පැන්නා. ජේසන් ඔවුන්ට පැහැදිලි කරලා දුන්නා තමන් ඔවුන්ගේ හතුරන් නොවන බව. නිර්භීත ජේසන් නිසා ජෙනී බේරුනා. "ඔයාලගේ නම් මොනවාද දරුවනේ?" නායක පිටසක්වල ජීවියා ඇහුවා. "මගේ නම ජේසන්, මේ මගේ නංගී ජෙනී."

"ඔයාලා මෙහෙ මොනවද කරන්නේ?" පුංචි පිටසක්වල මල්ලි ඇහුවා.

"අපි ආවේ ඔයාලව මුණගැහෙන්න" ජෙනී කීවා. "එතකොට ඔයාලා කොහොමද මෙහෙ ඉන්නේ? කන්නේ මොනවා ද?" ජේසන් ඇහුවා. " අපි කන්නේ අපිම හදපු රස කෑම" පිටසක්වල නැන්දා කෙනෙක් කිව්වා. " මොනවාද ඒ රස කෑම? " ජෙනී ඇසුවා.

" ඔයාලො ඇවිලා බලන්නකෝ" නායක පිටසක්වල ජීවියාගේ දුව කීවා. පාවෙන දළඹුවෝ, කටු නැති ගොළුබෙල්ලෝ, අං ඇති කටුස්සෝ, පියාඹන නයි, මාළු කැඳ .....

ඊ.... යා....... ජෙනීට කියවුනා. " අපි ඕවා කන්නේ නෑ." ජේසන්ට වමනෙට ආවා.

ඒත් එක පිටසක්වල අයියා කෙනෙක් එයාලගේ කටේ ගොළුබෙල්ලෝ දෙන්නෙක් එබුවා. ටිකක් වෙලා හප හපා ඉද්දි දැනුණේ පුදුම රහක්. " හරිම රසයිනේ " ජෙනී කීවා. " ඒක තමයි අපි කීවේ, දැන් එන්න ඉතින් අපි යමු අපේ ලෝකෙ වටේ රවුමක්" අළුත් යාළුවෙක් කිව්වා.

මේ තියෙන්නේ අපි නිදාගන්න ඇඳවල්, "ඒවා පාවෙනවා නේද ?" ජෙනී හා ජේසන් කෑගැසුවා. " අපි දුවල ගිහින් ඒවාට පැනල නිදාගන්නවා." පිටසක්වල බබෙක් කීවා.

" මේ තියෙන්නේ අපේ පිටසක්වල යානා, ඔයාලා දන්නවාද වල්ගා තරු ? " පිටසක්වල අයියා ඇසුවා. " ඔව්... ඔව්..." ජෙනී උත්තර දුන්නා. " අපි ඒ යානා වලින් ඔයාලගේ ලෝකෙට එනකොට තමයි ඔයාලට කඩා හැලෙන වල්ගා තරු පෙනෙන්නේ" නායකතුමා පැහැදිලි කළා. " ඔය ඇත්තමද ? " ජේසන් පුදුමයෙන් ඇසුවා.

එකපාරටම මහා භයානක ශබ්දයක් ඇසුණා...

" කවුද ඒ ....." ජෙනී වෙව්ලන්න ගත්තා.

"ඔය එන්නේ අපි හැමෝටම කරදර කරන මහා කරදරකාරයෙක්" නායකතුමා දුකෙන් කීවා. "එයාගේ නම ඕරාටෝ මොරාටෝ පුංචි දරුවනේ, ඔයගොල්ලොත් දුවලා ගිහින් හැංගෙන්න. එයා අපේ හැමදේම හොරකම් කරනවා, විනාශ කරනවා." නායකතුමා කීවේ හති දමමින්.

" බයවෙන්න එපා නායකතුමනි, එන්න අපි හැමෝම එකතු වෙලා එයාට හොඳ පාඩමක් උගන්වමු. ආයෙත් මෙහෙට නොඑන්නම" ජේසන් නිර්භීත හඬින් කීවා. "ඔයගොල්ලො තාම පුංචිනේ, ඒ නපුරා ඔයගොල්ලන්ට හිරිහැර කරාවි."

"බයවෙන්න එපා නායකතුමනි, අපේ මැජික් මාලිමාවයි, මැණික් යාළුවයි අපිට උදව් කරයි."

එහෙම කියපු ජේසන් මාලිමාවේ සටහන් කර තිබුණු රහස් වචන කියලා සටන් කඩු අතට ගත්තා. ජෙනීත් කිසිම බයක් නැතිව අයියාට එකතු වුණා.

රන්වන් මැණික් කැටය, මාලිමාවේ අශ්ව මුහුණත ඇත්ත අශ්වයෙක් බවට පත් කළා. ඒ හරිම විශාල, පියාඹන අශ්වයෙක්. නායකතුමා ජේසන්ටයි, ජෙනීටයි අශ්වයා පිටට නැග ගන්න උදව් කළා. පියාඹන අශ්වයා ඕරාටෝ මොරාටෝ ඉන්න දිශාවට වේගයෙන් පියෑඹුවා.

නපුරු ඕරාටෝ මොරාටෝ හයියෙන් ගෙරෙව්වා. ඒත් සූර වීර අයියයි, නංගියි පොඩ්ඩක්වත් බය වුණේ නැහැ. ජේසන් මැජික් කඩුව යොදාගෙන, ඉස්සරහට දුවගෙන ආපු ඕරාටෝ මොරාටෝ ගේ ගෙල කපා විනාශ කළා. "ස්තූතියි, දරුවනේ මේ නපුරු සතාගෙන් අපිව බේරාගත්තාට" නායකතුමා හරිම සතුටින් කීවා.

එදා ජේසනුයි ජෙනීයි වෙනුවෙන් අඟහරු ලෝකයේ ලොකු උත්සවයක් තිබුණා. හැමෝම ඒ දෙන්නාගේ නිර්භීතකම අගය කළා.

" දැන් අපිට යන්න වෙලාවත් හරි" ජෙනී කීවා. " ඔහොම ඉන්න මේ මැජික් ගල් ටික ළඟ තියාගන්න. මේවා ඔයගොල්ලන්ව අනතුරු වලින් ආරක්ෂා කරාවි" පිටසක්වල ලොකු සීයා කීවා.

''බොහොම ස්තූතියි'' ජේසන් ඒවා සතුටින් බාරගත්තා. '' එහෙනම් අපි ගිහින් එන්නම් යාළුවනේ'' අයියයි , නංගියි දුවගෙන ගිහින් මාලිමාවට පැන්නා.

'' පුතා, දුව .... කෝ මේ ළමයි දෙන්නා ? අද දවසටම කාමරයෙන් එළියට ආවේ නෑ නේද ?'' අම්මා දොර ඇරගෙන කාමරයට ආවා. ඒ පිටිපස්සෙන් ජෙරිත් වලිගය වනමින් ආවා.

'' මොනවද මේ අතේ තියෙන ගල් කෑලි, ඕවා විසි කරලා, ඇඟ සෝදාගෙන එන්න රෑ කෑමට.''

අම්මා කාමරයෙන් ගියාට පස්සේ අයියයි, නංගියි හොඳටම හිනා වුණා. ජෙරී පුදුමයෙන් වගේ බලාගෙන හිටියා. මාලිමාවයි, අඟහරු ලෝකෙන් ලැබුණු මැජික් ගල් ටිකයි ජේසන් පරිස්සමට අල්මාරියෙ අරන් තිබ්බා.

ජෙනී, ජේසන් සහ ජෙරී සතුටින් රෑ කෑමට ගියා. '' ඊළඟ සැරේ අපි ඔයාවත් ගෙනියන්නම් පැටියෝ'' කියමින් ජෙනී ජෙරීගේ ඔළුව අතගෑවා.

නිමි.

# මුහුදු පතුලට ගමනක්

''අයියේ, අපි අදත් මාලිමාව ඇතුලට යමුද?, ඒත් අපි කොහාටද යන්නේ?'' ජෙනී ඇසුවා. '' අපි යමුද මුහුදු පතුලට, මං ආසයි දිය කිඳුරියෝ බලන්න. හරි අපි එහෙනම් යමු, එහෙනම් අපි යනවා මුහුදු පතුලට''. මැණික් කැටය, එයාලට මුහුදු පතුලට යන්න අවශ්‍ය දේවල් දුන්නා. ඒ දෙන්නා මාලිමාවට පැන්නා. එයාලා දැන් ඉන්නේ මුහුදු පතුලේ. ජේසන්, ජෙනීගේ අත අල්ලගෙන පීනන්න පටන් ගත්තා. එයාලා ටිකක් පීනගෙන යනකොට ලස්සන මාළු, දේදුනු පාටින් කොරල් පර දැක්කා. '' තාම දිය කිඳුරියක් හම්බ උනේ නෑනෙ'' ජෙනී කීවා.

''අපි ටික දුරක් ගිහින් බලමු. එතකොට අපට දිය කිඳුරියක් හම්බවෙයි'' ජේසන් කීවා. එයාලා ඉස්සරහට යනකොට කවුරුහරි සින්දු කියනවා ඇසුණා. ''මමයි පුංචි දියකිඳුරිය... දියකිඳුරිය...... දියකිඳුරිය.......'' ''කවුද ඒ සින්දු කියන්නේ'' ජෙනී ඇසුවා. ''අපි ගිහිල්ලා ම බලමු'' ජේසන් රහසින් කිව්වා. එයාලා හොරෙන් එබිලා බැලුවා. ''අනේ...... හරි .... ම ලස්සන දිය කිඳුරියක්'' ජෙනී කෑගැසුවා.

ඒ හඬ ඇසුණු පුංචි දියකිඳුරිය එතනට පීනගෙන ආවා. '' ඔයාලද අර... අර..... පුංචි ළමයි කියන්නේ''. ''ඒ අපි තමයි, පුංචි දියකිඳුරිය'' ජෙනී කීවා. '' ඔයාලගේ නම් මොනවාද ? '' '' මගේ නම ජේසන්.'' '' මගේ නම ජෙනී.''

'' ඔයාලා කැමතිද මාත් එක්ක මගේ ගෙදර යන්න ? '' ''ඔව්, අපි කැමතියි''. ''එහෙනම්, ඔයාලා මගේ පිටිපස්සෙන් එන්නකො''. දිය කිඳුරිය කීවා. මේ තියෙන්නෙ අපේ ගෙදර කියා දියකිඳුරිය පෙන්නද්දී, දියකිඳුරි අක්කා එළියට ආවා. '' ඔයාලා කවුද ? '' ''මේ මගේ යාලුවෝ'' දියකිඳුරිය කීවා. '' අනේ හරි හොඳයිනේ, අපි ඔයාලට මෙහෙ ලස්සන තැන් පෙන්වන්නම්, එන්න අපිත් එක්ක'' ජෙනීයි, ජේසනුයි හරිම සතුටින් මුහුදු පතුලේ සිරි නැරඹුවා. පාට පාට හරි ලස්සන මාළුවෝ, ඒ ගොල්ලන් එක්ක තරඟෙට පීනුවා. '' මේ තියෙන්නේ අපි සෙල්ලම් කරන තැන'' පුංචි දිය කිඳුරිය කිව්වා. '' අක්කේ ඔයාගෙ නම කියන්න. මගේ නම ඉනී'' ''නමත් ඔයා වගේම ලස්සනයි''. එතකොට පුංචි දියකිඳුරියගෙ නම මොකක්ද?. '' මගේ නම හනා'' '' ඔයගොල්ලන් ඉන්න මුහුදු පතුල ඔයගොල්ලන් වගේම හරිම ලස්සනයි.'' ජෙනී කිව්වා.

ලස්සන කොරල් පරයක් දැක්ක ජේසන්, ඒකෙන් කෑල්ලක් කඩාගන්න ගියා.

'' අනේ යාලුවේ, ඕක නම් කරන්න එපා.'' පුංචි දිය කිඳුරිය කෑගැසුවා. ''මේ මුහුදු පතුලේ තියෙන එක කොරල් පරයක් හරි කඩා ගත්තොත්, මේ මුහුදෙ සිටින මාළුවන්ට ජීවත් වෙන්න බැරි වෙනවා. මොකද එතකොට මේ තියෙන හැමදේම විනාශ වෙලා යනවා.'' '' අනේ සමාවෙන්න, අපි ඒක දැනගෙන හිටියේ නැහැ.'' ජේසන් කිව්වා.

'' දැන් අපිට යන්නම වෙනවා.'' ජේසන් දුකින් කිව්වා. ඔයාලා මේකත් අරං යන්න, හනා පුංචි දිය කිඳුරිය තරුවක් වගේ බබළන මුතු බෙල්ලෙක් තෑගි දුන්නා. ''අපි ගිහින් එන්නම්'' කියලා ජෙනීයි ජේසනුයි පීනගෙන ගිහින් මාලිමාවට පැන්නා.

**නිමි.**

# කුරුලු උයනට චාරිකාවක්

"අද හරි කම්මැලි දවසක් නේද? ජෙනී" ජේසන් ඇහුවා. " ඔව්, අයියේ අපි අද මාලිමාවෙන් කුරුලු උයනට යමු ද ? " " ඒක හොඳයි ජෙනී, අපි දුවගෙන ගිහිල්ලා මාලිමාව ඇතුලට යමු." " ඔන්න අපි කුරුලු උයනට ආවා" ජේසන් කෑගැහුවා. කුරුලු උයනේ ගොඩාක් ලස්සන කුරුල්ලන් වර්ග හිටියා. ගිරව්, කුකුලෝ, මූණ රතු තාරාවෝ ඒ අතරින් කිහිප දෙනෙක්. "ජෙනී, අර බලන්න, වඩු කුරුලු පැටව්." ජෙනීයි ජේසනුයි සතුටින් කෑ ගැහුවා. " අනේ එයාලා හරි ලස්සන කූඩුවක් හදනවා."

එතකොට හරිම භයානක ශබ්දයක් ඇසුණා. එක පාරටම එතනට ආවේ හරිම භයානක මුහුණක් තියෙන පක්ෂියෙක්." අනේ අයියේ, මට හරි බයයි. මේ කවුද?" ජෙනී ඇහුවා. මේක දැකපු කුකුල් හාමි, ඒ කියන්නේ කුරුලු නායකයා එතනට දුවගෙන ආවා." දරුවනේ, ඔය ඉන්නෙ මහා භයානක සතෙක්. ඔතැනින් ඉක්මනට අයින් වෙන්න. නැත්නම් අපිට වගේම ඔයගොල්ලන්ටත් කරදර කරයි."

"කුකුළු හාමි බයවෙන්න එපා. අපි කොහොම හරි කරදර කාරයාගෙන් බේරෙමු." ජේසන්ටයි, ජෙනීටයි උදව් කරන්න මැණික් කැටයත් එතනට ආවා. " මෙන්න මේ සටන් කඩු දෙක ගන්න." මැණික් කැටය කෑ ගැහුවා.

'' ජෙනී අපි කොහොම හරි සටන් කරලා මේ නපුරුව පරද්දමු.'' '' ඉන්න පුංචි ළමයෝ, අපිත් එන්නම් .'' අනෙක් කුරුලු යාලුවො කිව්වා. ''හරි අපි එහෙනම් පටන් ගමු.'' ඒ භයානක කුරුල්ලා හොට උල් කරගෙන ඉස්සරහට පැන්නා. ඒක දැකපු ජේසන් කඩුවෙන් ඒ කුරුල්ලාගේ ගෙල සිඳ දැම්මා. ඒ තමයි නපුරු කුරුල්ලාගේ අවසානය.

''බොහොම ස්තූතියි, ඔය ළමයින්ට ඉස්සර ඉඳලා අපිට හිටපු හතුරෙක් තමයි ඔයාලා අද විනාශ කළේ. අපි ඒ හින්දා ඔය ළමයි වෙනුවෙන් අද සාදයක් පවත්වනවා. එන්න.. එන්න... අපි සාදය පටන් ගමු'' කුකුළු නායකයා කීවා.

''ළමයිනේ, ඔයාලගේ නම් මොනවාද ?'' ''මම ජේසන්, මේ ඉන්නේ ජෙනී, මගේ නංගි .'' අපි සාදය පටන් ගමු.

''අපි මුලින්ම මේගොල්ලන්ට පෙන්නමු මේ කුරුලු දූපතේ ලස්සන.'' ''මේ තියෙන්නෙ මගේ ගෙදර'' ගිරා හාමි කිව්වා. ''මේ තියෙන්නෙ අපි කෑම කන හෝටලය.'' කෑම දැකපු ජෙනීගෙයි, ජේසන්ගෙයි කටට කෙළ ඉනුවා. ''එන්න අපි යමු, මොනර පොඩි අයියාගේ අයිස්ක්‍රීම් කඩේට. අයියේ දෙන්නකෝ අපි හැමෝටම රසම රස විශේෂ අයිස්ක්‍රීම් '' '' මෙන්න ඔයාලට අයිස්ක්‍රීම් යාලුවනේ...'' ''ඔයාලට මේ හැමදේටම ස්තූතියි''

'' අපි දැන් ගියොත් හොඳයි. ඔන්න එහෙනම් අපි ගෙදර යනවා.''

'' පරිස්සමින් ගිහින් එන්න යාලුවනේ.'' ගිරා හාමි කිව්වා. ජේසන්, ජෙනී එක්ක දුවගෙන ගිහින් මාලිමාව ඇතුළට පැන්නා. එයාලා ගෙදර කාමරයෙන් මතුවෙන කොටම දොර ඇරගෙන ඇතුළට ආවේ කවුද දන්නවාද ? එයාලගේ පුංචි බලු පැටියා. ජේසන්ගේ කමිසයේ ඇලවිලා තිබුණු ලස්සන කුරුළු පිහිහාටුවක් ජෙනී හෙමින් සීරුවෙ පොතක් ඇතුළට දාගත්තා.

'' පුතේ, ඔය දෙන්නා පාඩම් වැඩ පටන් ගත්තා ද ? '' අම්මා ඇහුවා. දෙන්නා හිනාවෙවී පාඩම් කරන කාමරයට ගියා.

නිමි.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු .

මෙයට
**සෙනෙවිරත්න මහලේකම්**
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ
ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01